# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 8 ශ්‍රේණිය | සත්ත්ව වර්ගීකරණය | ඒකකය - 02 |
|---|---|---|

- **1 සිට 20 දක්වා ඇති ප්‍රශ්ණ වලින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

**1 .** පෘෂ්ඨවංශීන්ට අයත් නොවන කාණ්ඩය වන්නේ

i. පිස්කේස්ය ii. ඇම්ෆිබියාය iii. රෙප්ටීලියාය iv. නිඩාරියාය

**2 .** සඛණ්ඩ පණුවකු නොවන්නේ

i. කූඩැල්ලාය ii. පත්තෑපණුවාය iii. සලමන්දරාය iv. ගැඩවිලාය

**3 .** වැඩිම සත්ත්ව විශේෂ සංඛ්‍යාවක් අයත් කාණ්ඩය වන්නේ

i.උරගයින් වේ. ii. ආත්‍රොපෝඩාවන්වේ iii. පක්ෂීන්වේ iv. ක්ෂීරපායීන්වේ.

**4.** පේශිමය පාදයක් සහිත වීම, ශ්ලේෂ්ම දේහාවරණයක් සහිත වීම යන ලක්ෂණ දරන ජීවියකු වන්නේ,

i. බූවල්ලා ii. කැස්බෑවා iii. පණු ගෙම්බා iv. කූඩැල්ලා

**5.** හයිඩ්‍රා සතු ලක්ෂණයක් නොවේ

i. ජලජ ජීවීන් වේ. ii . විලෝපිකයන් වේ iii. ද්වි පාර්ශ්වික සමමිතික වේ. Iv. ග්‍රාහිකා පිහිටයි.

**6 .** උරගයකු නොවන්නේ,

i. ඉබ්බා ii. කිඹුලා iii. පත්තෑයා iv. පොළඟා

**7 .** උභය ජීවියකු වන්නේ,

i. කැස්බෑවා ii. දෙපියන් බෙල්ලා iii. ගොලුබෙල්ලා iv. පණු ගෙම්බා

**8.** රූපාන්තරණයක් සහිත වීම , තෙත සම හෝ පෙනහැලි සහිත වීම වැනි ලක්ෂණ දරන සත්ත්වයකු වන්නේ ,

i. තිලාපියා ii.ගෙම්බා iii. මෝරා iv.ඩොල්ෆින්

**9.** මැමේලියා කාණ්ඩයට අයත් ජීවියෙකි.

i. උණහපුලුවා ii.පැස්බරා iii. හංසයා iv.ඉස්සා

**10.** ආත්‍රොපෝඩා සතු ලක්ෂණයකි.

i.අරීය සමමිතිකවේ. ii.බාහිර කවච දරයි iii. සන්ධි සහිතවේ. iv. වරල් ඇත.

2.රූපසටහන් ආධාරයෙන් ජීවීන් හඳුනාගෙන පහත වගුව සම්පූර්ණ කරන්න.

| | | ජීවියාගේ නම | පෘෂ්ඨවංශී/ අපෘෂ්ඨවංශී | අයත් කාණ්ඩය | කාණ්ඩයට සුවිශේෂී ලක්ෂණ |
|---|---|---|---|---|---|
| උදා |  | ගිරවා | පෘෂ්ඨවංශී | ආවේස් | දේහයට අනුකූල හැඩයක් දරයි |
| 1 |  | | | | |
| 2 |  | | | | |
| 3 |  | | | | |
| 4 |  | | | | |
| 5 |  | | | | |
| 6 |  | | | | |
| 7 |  | | | | |
| 8 |  | | | | |
| 9 |  | | | | |
| 10 |  | | | | |